පින්සර දෝණී

එදිරිවීර විජේසූරිය

නොවැම්බර් මාසයෙ දහතුන් වැනිදාත් එළඹිලා. දිනය නම් දැකගත්තෙ ඛිත්තියේ එල්ලෙන දින දර්ශනය දිහා බැලුවමයි. සැඩ ගිරු කිරණ, සීතල සුළං රැළි, ගිගුරුම් සහිත වැසි, අතු ඉති පුරා එක යාපට පිපුනු මල් කිණිති - ඒ හැම දේම සමෝ සමේ අප වෙත රැගෙන ආව මෙදා පාර වසන්තයේ අග භාගයත් එළඹිලා බව සිහිවුනේ එතකොට. තවත් අවුරුද්දක් ගෙවී ගිමා-වෙන්න ආසන්නයි. දෙදහස් දහතුන නව වසරත් අත ළඟටම ඇවිත්.

ඕස්ට්‍රේලියාවට ආව දා ඉඳල අවුරුදු කීයක් නම් මේ වගේ හීන්සීරුවේ ගතවෙලා ගියාද ? මල්වෙඩි වරුසා මැදින් උත්සව ශ්‍රීයෙන් අළුත් අවුරුදු කීයක් නම් උදා වුනාද ?

අපෙන් සමහරු ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුනේ පුංචි දූ දරුවන් අතට - කරට වඩාගෙන. අනෙක් අයට දූ දරුවො ලැබුනෙ මේ රටට ආවට පස්සෙ. ඒ අයට අළුත උපන් බිළින්දන් බලන්න, තෑගි බෝග - මල්පොකුරු අරගෙන අපි ගියා ඒ දවස්වල.

ඒ ළපටි දූ පුතුන්ට අවුරුද්ද, දෙක, තුන.... හෙමිහිට පිරුනා. ඔහොම එයාලට අවුරුද්දෙන් අවුරුද්ද සපිරෙන උපන්දින උත්සව වලට දෙමව්පියන්ගෙ ආරාධනයෙන් අපි එක් රොක් වුනා. දරුවගෙ වයසට, අවුරුදු ගණනට හරියන්න ඉටිපන්දම් සවිකරපු විසිතුරු කේක් ගෙඩියක් කපල, රස මසවුළු තුක්ති විදල ජයටම සැමරුන උපන්දින වළඳි, අපි ඇවිත් කාලා බීලා සතුටුවෙලා පුංචි තෑග්ගක් දීල ගියා.



කෙළි පොඩ්ඩියක් කාලෙ ඉඳල. දූගේ තාත්තා, සමන්..... හිත හොඳ මනුස්සයෙක් හැටියට හිත මිතුරන් කවුරුත් හැමදාම දැන හඳුනගෙන හිටියෙ.

ඇත්තටම ඒක හරිම සුවිශේෂී ඇරයුම් පතක්. මනෝධ්‍යා දුවට අවුරුදු විසි එක සපිරෙන නොවැම්බර් විසි හතර වෙනිදාට "එපිං" හි සිසිටි ඔවුන්ගේ ගිවිසේ, දුව වෙනුවෙන් පැවැත්වෙන්නෙ උපන්දින සාදයක් නෙමෙයි. සුපින්බර පිරිත් සජ්ජායනාවක්.

පිරිත් පින්කමට සහභාගි වන මෙන් කෙරුනු සුභද ඇරයුමත් සමඟම මනෝධ්‍යා දුවගෙන් තව ලෙන්ගතු ඉල්ලීමක්. ඇරයුම් පතේ තිබුනු ඒ හෘදයාංගම සටහන අකුරක්වත් අඩු නොකර මම ඒ විදියටම මෙහි සටහන් කරන්නෙ ඇත්තටම එහි ඇති විශේෂත්වය නිසාමයි.

"මගේ උපන්දිනයට හැම අවුරුද්දෙම නො-

හැමදාමත් කෙරුනෙ ඒ එකම විදියට.

කාලය රහසින්ම අප පසුකර වේගයෙන් ඉදිරියට ගිහින්. අපි කෙමෙන් වියපත් වෙනව. අපි එදා වඩාගෙන හුරතල් කරපු, වොක්ලට් පෙත්තක් - පොඩි තෑග්ගක් අත තියල ආදරය පාපු පුංචි දූ පුත්නුත් කාලානුරූපව වෙනස් වෙලා. ඒ ගොල්ලො ලොකු මහත් වෙලා කරදඬු උස ගිහින්. ඒත් උපන්දින සාද රටාව නම් කවදාවත් වෙනස් උනේ නැහැ. විසිතුරු කේක් ගෙඩියක් කපල දරුවට සුභ පැතුවට පස්සෙ, මි විතක රස බලමින් දොඩමළු වෙන තාත්තලාත්, පිළිසඳර කතා බහේ ගිමක් නොදකින අම්මලාත් කෙළිදෙළෙන් විනෝද වෙන දූ පුතුනුත් එකතුවෙලා, රසවත් භෝජන සංග්‍රහයක් භුක්ති විඳල නටල - ගයල සතුටු වෙලා විසිර යන එක තමා හැමදාම කළේ. ජීවිත කාලෙම අපි දුවා දරුවන්ගෙ උපන්දින සැමරුවෙ එහෙම නේද ?

මේ අතීත ආවර්ජනා අතර මොහොතකට හිත නතර වුනේ නොවැම්බර් දහතුවන් වෙනිදා උදේම අතට ලැබුන, මනෝධ්‍යා දූගේ විසි එක් වන උපන් දිනයට ඇරයුම් කෙරුනු අපූරු ආරාධනා පතුය දුටුවමයි.
මනෝධ්‍යා දුව මම දන්නෙ අවුරුදු පහක විතර

වෙන්නෙ මේ පුංචි ගේ කෑල්ලෙ. පහේ ශිෂ්‍යත්වයෙන් සමත් වෙන්න අක්කට ඔදි වුනේ ලකුණු හතරයි. ඒත් ඈ අධෛර්ය වුනේ නැහැ. තමන්ට ළඟ කරගන්න බැරිවුන දේ තමන්ගෙ නංගිට ලබාදෙන්න ඒ අක්කා උපරිමයෙන් උත්සාහ ගත්තා. ඈ. නංගි පාසල් ඇරිල ආවට පස්සෙ පාඩම් කියා දුන්න. පොත්පත් ගන්න සල්ලි නැති නිසා තාත්ත පාරට වැටිල තියෙන පත්තර කෑලි අතුලගෙන ඇවිත් පුංචි දුවට කියවන්න දුන්නා. ඒ නංගි - අවුරුදු 11 ක් වයසැති රසානි දිලනිකා - පහේ ශිෂ්‍යත්වෙන් පාස් වුනා. අක්කයි ඇස් පෙන්නැති අම්මයි තාත්තයි ඒ සතුටට ඇඬුව.... ඒ කතාව අහල ලංකාවෙම හඳවත් තියෙන මිනිස්සු ඇඬුව..... ඒ පුංචි නංගිගෙ කතාව අපේ ඇස් වලටත් කඳුළු ගෙනාව. මේ අවුරුද්දෙ මගේ උපන් දිනය ඈ වෙනුවෙන් කැප කරන්න මං හිතුවා.

මේ අවුරුද්දෙ මගේ උපන්දිනය වෙනුවෙන් පැවැත්වෙන පිරිත් සජ්ජායනාව අසන්නට එක්වෙන්න කියල මම ආදරයෙන් ආරාධනා කරනවා. ඒත් මට තෑගි ගේන්න එපා. ඒ තෑගිවලට ඔයාල වියදම් කරන සල්ලි අපි එකතු කරමු. ඒ දුප්පත් නංගිගෙ අනාගතය වෙනුවෙන් ඒ මුදල් යොදවමු. තෑග්ගකින් ලබන සතුටට වඩා සිය දහස් ගුණයක සතුටක් අපි හැමදෙනාටම එයින් ලබාගන්න පුළුවන් නේද ? අපි හැමෝගෙම අත් වලින් රසානි දිලනිකා නංගිගෙ ඉදිරිමග ආලෝකමත් කරන්න එක පහනක් දල්වමු. මගේ ජීවිතයෙදි මං මෙතෙක් ලබපු හොඳම උපන්දින තෑග්ග එක් වෙන බව සිකුරුයි. "

වචන දහසකින් කියන්න බැරි දිග කතාවක් සරල සුගම වගන්ති කිහිපයකින් එකට ගොණු කළ ඒ සංවේදී සටහන මගේ හිතේ ගැඹුරුම තැනක සටහන් වුනා. රසානි දිලනිකාගේ සේයාරුවේ අගිංසක ඇස් දෙක මට සිහිකලේ මගේම පොඩි දුවගෙ බාල කාලය.

තමන්ගෙ 21වන උපන් දිනය අසරණ පුංචි නංගියෙක් වෙනුවෙන් කැප කරන්න කැමති වුනු මනෝධ්‍යා දූට, මේ වටිනා පිංකමට දුව යොමු කරපු ඇගේ දෙමාපියන්ට මම පින් දුන්නේ මුළු හිතින්ම. ඇරයුම් ලැබූ කවුරුත් හැකි උපරිම අයුරින් මේ සත්කාර්යයට සහය වෙන්න හිතට ගත්තෙ තමන්ගෙ හෘද සාක්ෂියට එකඟවමයි.

මේ ඇරයුම කාටත් නැවුම් අත්දැකීමක්, මෙතෙක් නෑසූ නුදුටු අපූර්වතම උපන් දින සැමරුමක් වුනා. හැම හිතකම එය ඇති කළේ පහන් හැඟීමක්. තාත්තා, සමන්ගෙ දුරකථනයට ඇමතුම් ගලා ආවා. "හොඳ වැඩක් - හොඳ ආදර්ශයක්" අහන දකින හැමෝම කිව්වේ එහෙම.

කෑගල්ල නගරයට නුදුරු පුංචි ගමක ජීවත් වන, දිස්ත්‍රික්කයෙන්ම ඉහළ ලකුණු ගෙන ශිෂ්‍යත්වය සමත් වුන රසානි දිලනිකා ගැන තාත්තා මුලින්ම දැනගන්නෙ ලක්බිම පුවත්පතේ පළවූ ලිපියකින්. මේ අසරණ පුංචි දැරිවිට උදව් කරන්න සූදානම් කරගත්තෙ පත්‍රයේ කතුතුමා මගින්.

තමුන්ට අවුරුදු 21 පිරෙන උපන් දිනයට සාදයක් ඕන නෑ කියලමයි මනෝධ්‍යා දුව මුල ඉඳලම අම්මටයි - තාත්තටයි කිව්වෙ. සාදයක් වෙනුවට පිරිත් පිංකමක් කරන යෝජනාව ගෙනාවෙ තාත්තා. දුව ඒකට මුළු හිතින්ම එකඟ වුනා. අම්මයි, තාත්තයි, එකම නංගියි එක්ක එකතු වෙලා පිරිත් පිංකමේ වැඩ කටයුතු වලට ඇය වෙහෙසුනේ ගොඩාක් සතුටින්.

මාස ගණනක ඉඳල තමුන්ගේ උපන් දින සාදයට සූදානම් වෙන, එදාට අඳින ඇඳුම් විලාසිතා තෝරන අපේ සමහර යොවුන් දූවරුං එක්ක සැසඳුවම මනෝධ්‍යා දුව ඊට කොයිතරම් වෙනස්ද ?

මනෝධ්‍යා දුවගෙ උපන් දවස උදා වුනා. එදා හැන්දෑවෙ, කාන්ති කඩාහැලෙන වෛර්ණ ඇඳුම් වෙනුවට සුසුදු වතින් - ලා පැහැයෙන් චාමෙට සැරසුරන අමුත්තන් ගෙන් ගෙදර පිරුණා. බැලුම් බෝල, ක්‍රේප් කොළ ඇතුළුව හරසුන් උපන්දින සැරසිළි කිසිවක් නොතිබුනු මැද සාලයේ අලංකාර පිරිත් මණ්ඩපයක් ඉදිවී තිබුනා. ඒත් තාත්තාගේ හොඳ අදහසක්. මට වැටහුණු විදියට, සමහර පුංචි දූ පුතුන්, පිරිත් මණ්ඩපයක් දුටුවේ, අම්මලාගෙන් ඒ ගැන අහල බලල දැනුවත් වුනේ එයාලගෙ ජීවිතේ පළමු වතාවට.

දහම් හිකේතන විහාරස්ථාන අධිපති, අතිගරු කෝට්ටේ සන්තින්ද්‍රිය හිමිපාණෝ ප්‍රමුඛ සංඝයා වහන්සේලා තෙනමක්, පිරිත් සජ්ජායනාව පිණිස වැඩම කළා.

පිරිත් පිංකමට කලින් දා ලොකු සාදයකින් තමාගේ 21 වන උපන් දිනය සැමරූ පුතෙක් තමාට තෑගි ලැබුන මුදලින් රසානි දැරියගේ අරමුදලට සෑහෙන ලොකු පරිත්‍යාගයක් කළා. ඕස්ට්‍රේලියාවේ ඉපදී, මෙහිදී හැදී වැඩුන ඒ පුතුගේ සම්මාදමත් ප්‍රශංසනීයයි. පිරිත් පිංකමට ඇරයුම් නොලදත්, රසානි ගැන ඇසූ සමහරු ඇය නමින් මුදල් ආධාර තාත්තා අතට පත් කළා. රසානිගේ අරමුදල දැන් ඩොලර් පන්දහස ඉක්මවා ගිහින්.

පුංචි රසානි ජීවත්වන ගරා වැටුණු ගෙපැළ වෙනුවට සවිබල ඇති පොඩි නිවහනක් ඉදිකරන්නට ඒ මුදල යෙදවීමයි, තාත්තා සමන්ගෙ අරමුණ. හවි හරණක් හැතිව, අනාරක්ෂිත පුංචි ගේ කෑල්ලක ඉඳගෙන මල් කැකුළු දොකක් වින් ලාබාල දුවරු දෙදෙනෙක් හදාවඩා ගන්න වෙර දරන දසස් අඳ අම්මෙකුට - තාත්තෙකුට ඒක මොනතරම් සහනයක් වේවිද ?

ඉදි කිරීම් කටයුතු හැකි ඉක්මනින් අරඹන්නට තාත්තා, සමන් දැන් කටයුතු සම්පාදනය කරගෙව යනවා. මේ සත්කාර්යය ගැන ඇසූ පින් කැමති හිතවතෙක්, නිවසට අවශ්‍ය දොර - ජනෙල් - උළුවහු සියල්ල සපයා දෙන්නට සූදානමින් සිටින බවත් ඔහු කීවේ සතුටින්. ඉදිරි කටයුතු කරගෙන යනවිට තව තවත් පින් කැමැත්තෝ මුණ ගැසේවි. පුංචි රසානිගෙ නව නිවස ඉක්මනින් තනා නිම කරන්නට තව තවත් ආධාර - උපකාර ලැබේවි.

රසානි එයාගේ අක්කයි, දස් නොපෙනෙන අම්මයි - තාත්තයි එක්ක ඔවුන් වෙනුවෙන් අළුත හැදෙක පුංචි නිවහනේ පදිංචි වෙලා සැනසිල්ලේ හුස්ම ගන්න දවස වැඩි ඈතක වෙන්න බැහැ. එදාට අර අපි සේයාරුවේ දැකපු අන්ත අසරණ පුංචි මුහුණේ ලස්සන හිනා රැල්ලක් ඇඳේවි.

මනෝධ්‍යා දුවටත් එදාට ගොඩක් සතුටු වෙන්න පුළුවන්. ශ්‍රී ලංකාවෙ දුර ඈත පුංචි ගම්මානයක ජීවත් වෙන අගිංසක පුංචි නංගියෙකු වෙනුවෙන් පරිත්‍යාග කරපු තමන්ගෙ විසි එක් වන උපන්දින උත්සවය ඇයට හැඳෙදාම සතුටින් සිහිකළ හැකි සුන්දර මතකයක් වෙන බව අනුමානයි.